# ඇමෙරිකානු තානාපති කාර්යාලය, කොළඹ

## ලියාපදිංචි හෙද නිලධාරී [පුරුෂ/කාන්තා]

කොළඹ ඇමෙරිකානු තානාපති කාර්යාලය විසින් අපගේ වෛද්‍ය අංශයේ ලියාපදිංචි හෙද නිලධාරී තනතුර සඳහා සුදුසුකම් ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**කාන්තා සහ පුරුෂ දෙපාර්ශවයම මෙම තනතුර සඳහා අයදුම් කරනු ඇතැයි අපේක්ෂා කරමු. ඇමෙරිකානු තානාපති කාර්යාලය ජාතිය, වර්ණය, ආගම, ලිංග භේදය, ජාතිකත්ව සම්භවය, වයස, ආබාධිතභාවය, දේශපාලන පක්ෂපාතීත්වය, විවාහක/අවිවාහක බව හෝ ලිංගිකත්ව අභිමතය යන කරුණු නොසලකන අතර මානව විවිධත්ව ශ්‍රම බලකායක් යටතේ සමාන අවස්ථා වෙනුවෙන් කටයුතු කරනු ලබයි. ඔබගේ මානුෂීයභාවයන්, කරුණාවන්ත බවත් ඉතාමත් වැදගත් වේ. ඔබගේ ලිංගික, ආගමික හා දේශපාලනික අභිමතයන් පිළිබඳ නොව, ශ්‍රී ලංකාවේ සිටින අන් කිසිවෙකුටත් වඩා උසස් අන්දමින් රැකියාව කිරීමට ඔබට ඇති හැකියාව පිළිබඳ පමණක් අප සැලකිලිමත් වේ.**

මෙම තනතුර දරන්නා හෙද නිලධාරියෙකු ලෙස තානාපති කාර්යාල සේවකයන් හට වෛද්‍ය සේවා ලබාදිය යුතු අතර සියලුම වෛද්‍ය උපකරණ සහ භාණ්ඩ වල තොග ලේඛන පවත්වාගෙන යාමත්, ශක්තිමත් එන්නත්කරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමත්, කණ්ඩායම් සහ තනි පුද්ගල සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් පරිපාලනයත්, හදිසි වෛද්‍ය කටයුතු වෙත ප්‍රතිචාර දැක්වීම සඳහා සැලසුම් නිර්මාණය කිරීම සහ සොටුම්පත් කිරීමත් ඇතුළුව සියලුම වගකීම් ඉටුකළ යුතු ය. හෙද නිලධාරියා ඇමෙරිකානු වෛද්‍ය සේවා සපයන්නාගේ සෘජු අධීක්ෂණය යටතේ වෛද්‍ය අංශයේ සේවය කරනු ලබයි.

**පූර්ණ කාලීනව සතියකට පැය 40 ක සේවා කාලයක් සහිත මෙම තනතුර සඳහා මාසික දළ වැටුප රු. 194,659/- කි.**

### අවශ්‍ය සුදුසුකම්:

1. **අධ්‍යාපනය** - (ලියාපදිංචි හෙද නිලධාරී මට්ටමේ) හෙද උපාධියක් හෝ පිළිගත් හෙද විද්‍යාලයකින් පිරිනමන ලද උපාධියකට සමාන ඩිප්ලෝමාවක් / සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබිය යුතු ය. එමෙන්ම මේ වන විට පවත්වාගෙන යන වලංගු හෙද බලපත්‍රයක් නැතහොත් සත්කාරක රටෙහි හෝ තමන් උපන් රටෙහි හෝ එක්සත් ජනපදයේ හෙද වෘත්තිකයෙක් ලෙස සේවය කිරීම සඳහා නිකුත් කරන ලද වලංගු, සීමාවන්ට යටත් නොවූ, ලියාපදිංචි හෙද බලපත්‍රයක් තිබිය යුතු ය. **(අදාළ අධ්‍යාපනික සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය).**
2. **පූර්ව රැකියා පළපුරුද්ද** - අධ්‍යාපන සුදුසුකමින් පසුව වෘත්තීමය හෙද නිලධාරියෙක් ලෙස අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් තිබිය යුතු ය. **(අදාළ සේවා සහතිකපත් මේ සමග අමුණා එවිය යුතු ය).**
3. **භාෂා ප්‍රවීණතාවය** - IV වන මට්ටමේ (ව්‍යක්ත ප්‍රවීණතාවයක්) ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ. **(මෙය පරීක්ෂා කරනු ලැබේ).**
4. **නිපුණතා සහ හැකියාවන්** - පරිගණක මඟින් මූලික මට්ටමේ වර්ඩ් ප්‍රොසෙසරයක් භාවිතා කිරීමේ හැකියාව තිබිය යුතු ය.

### අවශ්‍ය ලේඛන:

මෙම තනතුර සඳහා අයදුම් කිරීමට, අයදුම්කරුවන් විසින් **විද්‍යුත් අයදුම්පත සමඟ පහත ලේඛනවල විද්‍යුත් පිටපත් ඉදිරිපත් කළ යුතුය.** එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් මෙම රැකියා අවස්ථාව සඳහා නුසුදුසු සේ සැලකේ.

- අදාළ අධ්‍යාපන සහතික
- අදාළ සේවා/කාර්යය පළපුරුද්ද පිළිබඳ සහතික
- අදාළ හෙද බලපත්‍රය හෝ දැනට පවතින, සීමාවන්ට යටත් නොවූ, ලියාපදිංචි හෙද බලපත්‍රය
- පුරවැසිභාවය සනාථ කිරීමේ ලියවිලි (ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය සහ/හෝ වැඩ බලපත්‍ර)

### අයදුම් කරන ආකාරය:

ඔබගේ අයදුම්පත ඉලෙක්ට්‍රොනික බඳවා ගැනීමේ යෙදවුම් පද්ධතිය **[ERA]** හරහා ඉදිරිපත් කිරීම සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වන **https://lk.usembassy.gov/embassy/jobs/** වෙත පිවිසෙන්න. ඔබ විසින් අදාළ අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අපගේ වෙබ් අඩවියේ සඳහන් කර ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**තැපැල් හෝ ඊමේල් මඟින් එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.**

ඔබගේ අයදුම්පත 2022 ජූනි 01 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන්නට සලස්වන්න.
තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවන බව කාරුණිකව සලකන්න.